ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 38 දරන හෙළ හවුල (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අගෝස්තු මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව රු. 1.00 යි.

Scanned by CamScanner

# 1992 අංක 38 දරන හෙළ හවුල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 42/87

**හෙළ හවුල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"හෙළ හවුල" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංවිධානයක්, ඒ සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සංවිධානයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ජයවර්ධනපුර ඇතුල් කෝට්ටේ කොටු බැම්ම පාරේ අංක 49 දරන ස්ථානයෙහි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: — පූර්විකාව.

ඒ සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ සංවිධානය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කරගෙන ගොස් ඇති හෙයින් ද ඒ සංවිධානය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 38 දරන හෙළ හවුල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භවන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) හෙළ හවුලෙහි තත්කාලයේ සාමාජිකයන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් සංඛ්‍යාව (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "හෙළ හවුල" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද එකී සංස්ථාපිත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමට සහ එය පාවිච්චි කිරීමට ද සංස්ථාවේ කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. — හෙළ හවුල සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— — සංස්ථාවේ සාධාරණ පරමාර්ථ.

(අ) හෙළ බස, සාහිත්‍ය සහ සංස්කෘතිය නංවාලීම සහ වැඩි දියුණු කිරීම;

(ආ) සිංහල ජනතාවගේ අයිතිවාසිකම් සහ අර්ථසිද්ධි ආරක්ෂා කිරීම;

(ඇ) ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම සහ පැවැත්වීම;

Scanned by CamScanner

(ඈ) භාෂා පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීම සහ සාහිත්‍යය කෘතීන්ට ප්‍රචාරයක් දීම ;

(ඉ) සිංහල ජනතාව අතර එක්සත්භාවය ඇති කිරීම සහ පාරම්පරික ආධ්‍යාත්මික අගැයුම් ඔවුන් අතර ඇතිරවීම ; සහ

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීමට හිතකර හෝ ආනුෂංගික වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ඉටුකිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුව ද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, සිදු කිරීමේ සහ ක්‍රියාවේ යෙදීමේ බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

මධ්‍යම කාරක සභාව.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සහ එකී රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන මධ්‍යම කාරක සභාවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පළමු වන මධ්‍යම කාරක සභාව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංවිධානයෙහි සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි රීති පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන්, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, වර්ග කිරීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සහ සාමාජික ගාස්තු ;

(ආ) මධ්‍යම කාරක සභාවට සහ විවිධ අනුකාරක සභාවලට සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේ ක්‍රමය, ඒ කාරක සභාවලින් සාමාජිකයන් ඉල්ලා අස්වීම, තම ධුර හිස් කිරීම, ධුරවලින් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, හැසිරීම සහ ඔවුන් සතු කාර්යය ;

Scanned by CamScanner

(ඇ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම හෝ තෝරා පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ මධ්‍යම කාරක සභාවේ සහ විවිධ අනුකාරක සභා වල රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී ගත යුතු ක්‍රියා පටිපාටිය සහ ඒ රැස්වීම් පැවැත්විය යුතු වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, ඒ රැස්වීම් වල න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කළ යුතු කටයුතු ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම හා විගණනය කිරීම ; සහ

(ඊ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ කවර වුව ද රීතියක (1) වන උප වගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයෝ සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත් විය යුත්තාහ.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති සංවිධානයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සංවිධානයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය. සංවිධානය විසින් ගෙවිය යුතු සහ සංවිධානයට අය විය යුතු ණය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීම මගින් හෝ වෙනත් යම් ආකාරය කින් සංස්ථාව සතු වන නිශ්චල හෝ චංචල යම් දේපළක් අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීති වලට යටත්ව, සංස්ථාව විසින් ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය. සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. මධ්‍යම කාරක සභාව විසින් කලින් කල බලය පවරනු ලැබූ තැනැත්තන් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි නම නම් අත්සන් කළ යුතු අතර, එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

Scanned by CamScanner

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මගින් හා ඔවුන් යටතේ හිමිකම් දක්වන වෙනත් තැනැත්තන් හැර, ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

Scanned by CamScanner

[illegible]

Scanned by CamScanner